# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1983 අංක 20 දරන ණය සහනදයක (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 ජූනි මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1983 ජූනි මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිළ : ශත 35 යි    තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 20 දරන ණය සහනදායක (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 ජූනි මස 23 වන දින.]

එල්. ඩී.—ඕ. 18/81

**ණය සහනදායක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 20 දරන ණය සහනදායක (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන ණය සහනදායක ආඥාපනතෙහි 1950 අංක 5 දරන පනතින් ඇතුළත් කරන ලද 19අ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 81 වන අධිකාරයේ 19අ වගන්තිය සංශෝධනය කිරීම.

"(1) මේ ආඥාපනතේ අර්ථානුකූලව යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් උකසක් වන එවැනි යම් පොරොන්දු සින්නක්කරයකින් ආරක්ෂිත යයි අදහස් කරනු ලබන ණයක් සම්බන්ධයෙන් ණයකරුවකු විසින් හෝ ණය හිමියකු විසින් හෝ ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමක්, ඒ ණයකරු සහ ඔහුගේ ණය හිමියා අතර වූ නීත්‍යනුකූලව බලාත්මක කරනු ලැබිය හැකි යම් ගිවිසුමක් ප්‍රකාර ණයකරු විසින් ඒ දේපළ බේරුම් කර ගනු ලැබිය හැකි වන්නේ යම් කාලයක් ඇතුළත ද ඒ කාලය ඉකුත් වීමට පෙර කරනු ලැබුවේ නම් මිස, මණ්ඩලය විසින් ඒ ඉල්ලීම භාර ගනු නොලැබිය යුතු ය.".

3. 1950 අංක 5 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියෙහි "ණයකරු" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

'"ණයකරු" යන්නෙන්—

(i) යම් නිශ්චල දේපළක් හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන් උකසක් හෝ බැඳීමක් ඇති කරනු ලැබ ඇත්තා වූ සහ ඒ දේපළ සම්බන්ධයෙන් වූ ස්වකීය ණය නියමිත මුදල් ප්‍රමාණය ඉක්මවන්නා වූ; නැතහොත්

(ii) පොරොන්දු සින්නක්කරයක් මත නිදහස් වීමේ අයිතියක පැවරුම්ලාභියකු වන්නා වූ

තැනැත්තකු අදහස් වන අතර, ඒ තැනැත්තාගේ උරුමක්කරුවන්, පොල්මඃකරුවන් සහ අද්මිනිස්ත්‍රාසිකරුවන් ද ඊට ඇතුළත් වන්නේ ය.'.

2—ඒ 68462—9,075 (83/05)

[illegible]

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.